# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**2107/33 – 2019 ජනවාරි 23 වැනි බදාදා – 2019.01.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්කිස්ස ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/ආර්ටීඑම්/2018/67 හා 2018.06.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 1 – ගාලු පාරේ වරි. අංක 330/4 දරන ඉඩම (කොටසක්) – ප්‍රමාණය: හෙක්. 0.0021**

උතුරට: ගාලු පාරේ වරි. අංක 14 දරන ඉඩම; නැගෙනහිරට: ගාලු පාරේ වරි. අංක 330/4 දරන ඉඩම; දකුණට: වටරවුම් පාර; බටහිරට: සර්කියුලර් පාර.

02. **කැබලි අංක 4 – ගාලු පාරේ වරි. අංක 334 දරන ඉඩම (කොටසක්) – ප්‍රමාණය: හෙක්. 0.0018**

උතුරට: පාර; නැගෙනහිරට: ගාලු පාර; දකුණට: ගාලු පාරේ වරි. අංක 334 දරන ඉඩම; බටහිරට: පාර.

03. **කැබලි අංක 5 – ගාලු පාරේ වරි. අංක 330 සහ 330ඒ දරන ඉඩම (කොටසක්) – ප්‍රමාණය: හෙක්. 0.0021**

උතුරට: ගාලු පාරේ වරි. අංක 330 සහ 330ඒ දරන ඉඩම්; නැගෙනහිරට: ගාලු පාර; දකුණට: කැබලි අංක 2; බටහිරට: ගාලු පාරේ වරි. අංක 330/1 දරන ඉඩම.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/යූඩීඒ/245.
2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 278


1A – G 29310 – 16 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*